# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2160/41 - 2020 ජනවාරි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් එකී පනතේ 21 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ රජරට විශ්ව විද්‍යාලය පිහිටුවමින් (2019 මාර්තු මස 18 වන දින අංක 2115/6 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 1995 නොවැම්බර් මස 7 වන දින අංක 896/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එකී උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "කළමනාකරණ අධ්‍යාන පීඨය" යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන "4. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන්:-

"5. තොරතුරු පද්ධති අධ්‍යයන අංශය" ; සහ

(2) එකී උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ව්‍යවහාරික විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන "6. පරිගණක අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන එකතු කිරීමෙන්:-

"7. රසායන විද්‍යා අධ්‍යයන අංශය".

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 ජනවාරි මස 29 වන දින,
කොළඹ දී ය.

02-271

1A - PG 4857 – 518 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*